සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

## II වන ශ්‍රේණියේ රේගු පරීක්ෂකවරුන් සඳහා පැවැත්වෙන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (පැරණි නිර්දේශය) - 2016 (II) (2017)

## (01) රේගු නීතිය හා ක්‍රියා පරිපාටිය

පැ දෙකයි

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. ආනයනය සීමා කළ භාණ්ඩ හෝ ආනයනය තහනම් කළ භාණ්ඩ සම්බන්ධව රේගු ආඥාපනතේ කවර වගන්ති ක්‍රියාත්මක වේ ද? එවැනි භාණ්ඩ කිහිපයක් උදාහරණයට ගෙන පැහැදිලි කරන්න. *(ලකුණු 20 යි)*

2. මහජනයා තම සේවාවන් ඉටුකර ගැනීමට පැමිණෙන ස්ථානයක දොරටුවේ ඔබ රාජකාරි ඉටු කිරීමට පත්කළ අවස්ථාවක දී ඔබ, මහජනයාට රේගු දෙපාර්තමේන්තුවේ ගෞරවය රැකෙන පරිදි සහාය වන්නේ කවර අයුරින් ද? පැහැදිලි කරන්න. *(ලකුණු 20 යි)*

3. රේගු පරීක්ෂකවරයකු නිසි අයුරින් සාක්කු සටහන් පොතක් පවත්වාගෙන යා යුතු ආකාරය පහදන්න. *(ලකුණු 20 යි)*

4. ඔබ ගුවන්තොටුපලේ විවිධ ස්ථානවල රේගු පරීක්ෂකවරයකු ලෙස රාජකාරි ඉටුකිරීමට පත්කළ හැකි ය. ගුවන්තොටුපලේ මගී පර්යන්තය තුළ ඔබ අනුයුක්ත කළ හැකි ස්ථාන නම් කර, එම ස්ථානවල ඉටුකරන රාජකාරි කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 20 යි)*

5. ඔබ වරායේ රාජකාරියේ යෙදී සිටින අවස්ථාවක දී නැවකින් කිසියම් භාණ්ඩ කිහිපයක් මල්ලක සඟවා ගොඩ බසින අයකු නිරීක්ෂණය විය. මෙවැනි අවස්ථාවක දී ඔබ ක්‍රියාත්මක විය යුතු ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 20 යි)*

6. (i) කොළඹ නිවාරණ කාර්යාලය යටතේ පාලනය වන උප නිවාරණ කාර්යාල නම් කරන්න.
   (ii) එම උප නිවාරණ කාර්යාලවල කාර්යභාරය පහදන්න.
   *(ලකුණු 20 යි)*

7. ආනයන හෝ අපනයන සිදු කිරීමේ දී හිතාමතා කරන රේගු වරදක් සම්බන්ධව ආනයන හෝ අපනයනකරුට භාණ්ඩ අහිමි කිරීමට අමතරව දණ්ඩන නියම කළ හැකි ය. මේ දණ්ඩන පැනවීම සම්බන්ධ රේගු ආඥාපනතේ වගන්ති නම් කර, පැහැදිලි කරන්න. *(ලකුණු 20 යි)*

8. රේගු පරීක්ෂකවරයකු රැකිය යුතු ආචාරධර්ම කිහිපයක් නම්කර, ඒවා විස්තර කරන්න. *(ලකුණු 20 යි)*

* * *